# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2391/28 – 2024 ජූලි මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2024.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021 - 2031 ගාලු කොටුව පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වූ සැලසුම් නියෝග හා නියමතා සංශෝධනය කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (ඌ) වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 හි 9.2 දරන පරිච්ඡේදයට කරන ලද සංශෝධනයන්, 2024 මැයි මස 29 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් ගාලු කොටුව පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වූ සැලසුම් නියෝග හා නියමතා අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා. ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජුනි මස 13 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර -11,
බත්තරමුල්ල.

1A – G 42165 – 19 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021 - 2031 ගාලු කොටුව පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වූ නියෝග හා නියමතා අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (ඌ) වගන්ති ප්‍රකාරව මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 හි 9.2 දරන පරිච්ඡේදයට කරන ලද සංශෝධනයන්, 2024 ජූනි මස 13 දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර -11,
බත්තරමුල්ල.

**මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021 - 2031 ගාලු කොටුව පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වූ නියෝග හා නියමතා අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව මහා ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 ගාලු කොටුව පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වූ සංවර්ධන සැලැස්මෙහි 9.2 පරිච්ඡේදයට කරන ලද සංශෝධනයන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 ජූනි මස 13 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

EOG 07 - 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.